# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2259/33 - 2021 දෙසැම්බර් මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2021.12.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

5 වන සංශෝධනය

**විගණන පරීක්ෂක සේවයේ සේවා ව්‍යවස්ථාව**

පහත I කොටසෙහි සඳහන් පරිදි සංශෝධනය කරන ලද 1985 දෙසැම්බර් මස 20 වැනි දිනැති අංක 380/61 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද විගණන පරීක්ෂක සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත II කොටසෙහි දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී. මෙම සංශෝධිත විධිවිධානයන් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණය ගනු ලැබූ 2021 සැප්තැම්බර් 13 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එම්.ඒ.බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 දෙසැම්බර් මස 22 වැනි දින,

**I කොටස**

| | |
|---|---|
| සංශෝධන අංක 01 | - 2008 ජුනි මස 13 වැනි දින හා අංක 1553/32 *අති විශෙෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 02 | - 2008 ඔක්තෝබර් මස 09 වැනි දින හා අංක 1570/30 *අති විශෙෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 03 | - 2016 නොවැම්බර් 09 වැනි දින හා අංක 1992/21 *අති විශෙෂ ගැසට් පත්‍රය* |
| සංශෝධන අංක 04 | - 2017 ජුනි 02 වැනි දින හා අංක 2021/46 *අති විශෙෂ ගැසට් පත්‍රය* |

**II කොටස**

2. සේවයේ ව්‍යුහය:-

"අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/1274/301/017 දරන," විගණන දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම" මැයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2021 ජූලි මස 8 දිනැති සංදේශය සඳහා ලබා දී ඇති 2021 සැප්තැම්බර් මස 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, විගණන පරීක්ෂක සේවය පහත තනතුරු නාම, කාර්ය මණ්ඩලය හා වැටුප් පරිමාණයන්ගෙන් සමන්විත වේ.


1A - G 35639 — 15 (2021/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

I. සේවා ගණයට අදාළ තොරතුරු :-

| සේවා ගණය | තනතුරු නාමය | වැටුප් කේතය | ආරම්භක වැටුප් පියවර | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ක්ෂේත්‍රගත/කාර්යාලගත | විගණන නිලධාරි | AS-01 | 1 පියවර | 1090 |
| කළමනාකරණ සහකාර අධි පන්තිය | සහකාර විගණන අධිකාරි | AS-02 | 6 පියවර | 360 |

II. වැටුප් පරිමාණ - AS - 02
රු. 41,580-11x755-18x1,030-68,425

- AS - 01
රු. 36,585-10x660-11x755-15x930-65,440

EOG 12 - 0251

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.